සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2026
தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2026/Grade 13 Final Term Test - 2026

0144

ගිණුම්කරණය - I

33 | S | I

කාලය / நேரம் / Time } පැය 2 යි

නම / பெயர் / Name } .... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ....

උපදෙස්:

* සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්ණ සඳහා නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* ප්‍රශ්න අංක **31** සිට **50** දක්වා වූ ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු අදාළ තිත් ඉර මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමිවේ
* වැඩසටහන් සම්පාදනය කල නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

1. මූල්‍ය ගිණුම්කරණය සම්බන්ධව අසත්‍ය ප්‍රකාශය වන්නේ,
   (1) තොරතුරු ඉල්ලා සිටිය නොහැකි පාර්ශව වෙත තොරතුරු සපයයි
   (2) ව්‍යාපාරයේ කළමනාකාරිත්වයටද මෙමගින් තොරතුරු සපයයි.
   (3) අවශ්‍ය ඕනෑම විටෙක ඕනෑම පාර්ශ්වයකට තොරතුරු සපයයි
   (4) ගිණුම්කරණ ප්‍රමිත හා මූලධර්ම වලට අනුව කටයුතු කරයි.
   (5) ඇල්මැති පාර්ශ්ව වලට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සපයයි. (..........)

2. ව්‍යාපාරයක් විසින් සිදුකර ඇති පහත ගනුදෙනු සඳහා වඩාත් අදාළ වන ගිණුම්කරණ සංකල්ප අනුපිළිවෙළ වන්නේ,
   A - අයිතිකරුගේ රු.10,000 ක රක්ෂණ වාරිකය ව්‍යාපාරයේ මුදලින් ගෙවීම හා එය පොත්වල සටහන් කිරීම.
   B - ගිණුම් වර්ෂය අවසන් මාසයේ නොගෙවූ රු.15,000 ක විදුලි බිල මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම.
   C - කල්බදු ක්‍රමය යටතේ ලබාගත් මෝටර් රථයේ කල්බදු වගකීම ජංගම හා ජංගම නොවන ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගැනීම.
   (1) ඒකක, උපචිත, අඛණ්ඩ පැවැත්ම
   (2) ඒකක, උපචිත, උපලබ්ධි
   (3) ඒකක, ආරක්ෂණ, අඛණ්ඩ පැවැත්ම
   (4) මූල්‍ය මිනුම්, උපචිත, උපලබ්ධි
   (5) ඒකක, ආරක්ෂණ, උපලබ්ධි (..........)

3. වෙළඳ ලැබිය යුතු දෑ සඳහා අපේක්ෂිත හානි කරන අලාභ සඳහා ඉඩ හැරීම ගිණුම්ගත කිරීමට පදනම් වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,
   (1) ගැලපුම් (2) කාලච්ඡේද (3) උපලබ්ධි (4) උපචිත (5) ආරක්ෂණ
   (..........)

• **4, 5 හා 6 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.**
2026 ජනවාරි මාසයේ මුල් සතියේ චතුරගේ ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදුවී ඇත.
චතුර ගේ ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී ඇත. VAT අනුපාතය 18% කි.

1. පිරිවැය රු.150,000 ක් වූ භාණ්ඩ තොගයක් රු.354,000 කට ණයට විකුණන ලදී. එහි ඇතුළත් VAT රු.54,000 කි.
2. ලැබිය යුතු රු.354,000 ක මුදල සඳහා රු.24,000 ක වට්ටමකට යටත්ව මුදල් ලබා ගත්තා.
3. පිරිවැය රු.300,000 ක් වූ භාණ්ඩ, VAT සහිත මිල රු.708,000 කට අත්පිට මුදලට විකිණීම.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
Scanned with CamScanner

4. ඉහත ගනුදෙනුවලින් පසුව ගිණුම්කරණ සමීකරණයේ ශුද්ධ බලපෑම වන්නේ,

	වත්කම් =	වගකීම් +	හිමිකම
(1)	204 000	54 000	150 000
(2)	174 000	38 000	136 000
(3)	408 000	108 000	300 000
(4)	564 000	162 000	402 000
(5)	588 000	162 000	426 000

(...........)

5. ඉහත 1,2 ගනුදෙනු පොත්වල සටහන් කිරීම සඳහා භාවිතා කරන මූලාශ්‍ර ලේඛන අනුපිළිවෙළින්,

(1). ඉන්වොයිසිය, ලදුපත (2) ලදුපත, ඉන්වොයිසිය (3) ඉන්වොයිසිය, හරපත
(4). ඉන්වොයිසිය, බැරපත (5) ඉන්වොයිසිය, වවුචරය (...........)

6. ඉහත 1 වන ගනුදෙනුව සටහන් කිරීම සඳහා නිවැරදි ද්විත්ව සටහන කුමක්ද?

		හර (රු.000)	බැර (රු.000)
(1)	ණයගැති පාලන ගිණුම	354	
	VAT පාලන ගිණුම		54
	විකුණුම් ගිණුම		300
(2)	VAT පාලන ගිණුම	54	
	විකුණුම් ගිණුම	300	
	ණයගැති පාලන ගිණුම		354
(3)	මුදල් පාලන ගිණුම	354	
	VAT පාලන ගිණුම		54
	විකුණුම් ගිණුම		300
(4)	ණයගැති ගිණුම	354	
	විකුණුම් ගිණුම		354
(5)	මුදල් පාලන ගිණුම	354	
	විකුණුම් ගිණුම		354

(...........)

7. සීමා සහිත මිහින් ලංකා සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා පහත තොරතුරු ඔබට සපයා ඇත. සමාගම VAT සඳහා ලියාපදිංචි වී ඇති අතර VAT අනුපාතය 18% කි.

	(රු)
ආරම්භක තොගය	40 000
ගැනුම් (VAT සහිත)	354 000
2025.04.01 VAT (බැර)	25 000
2026.03.31 VAT (බැර)	12 000
දළ ලාභය	170 000
වර්ෂය තුළ මුදලින් ගෙවූ VAT	40 000

2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා VAT සහිත විකුණුම් වටිනාකම හා එදිනට අවසාන තොගය වන්නේ,

	විකුණුම් (VAT සහිත) (රු)	අවසාන තොගය (රු)
(1)	450 000	114 000
(2)	500 000	80 000
(3)	531 000	60 000
(4)	531 000	114 000
(5)	450 000	60 000

(...........)

- **ප්‍රශ්න අංක 8 හා 9 සඳහා පහත තොරතුරු අදාළ වේ.**

බැංකුව විසින් මල්මිගේ ව්‍යාපාරය වෙත එවන ලද 2026 මාර්තු මාසයේ බැංකු ප්‍රකාශනයේ පහත තොරතුරු උපුටාගෙන ඇත.

- 2026.03.01 දිනට ආරම්භක බැර ශේෂය රු.15,000 කි. මාර්තු මාසය තුළ බැංකුව විසින් ගෙවන ලද චෙක්පත්වල වටිනාකම රු.40,000 කි. බැංකුවට මාසය තුළ බැර වූ චෙක්පත් වල වටිනාකම රු.50,000 කි. (සෘජු ප්‍රේෂණ හැර)
- බැංකුවට සෘජුවම ලද ලාභාංශ රු.30,000 කි.
- ස්ථාවර නියෝග මත ගෙවීම් රු.16,000 කි.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

- මාර්තු මාසය තුළ ව්‍යාපාරය රු.60,000 ක චෙක්පත් නිකුත් කර ඇති අතර රු.80,000 ක චෙක්පත් තැන්පත් කර ඇත. මාර්තු 1 දිනට ආරම්භක ශේෂ සමාන වී ඇත.
- මාර්තු මාසය තුළ බැංකුව අයකල ගාස්තු රු.2,000 කි.
- සෘජු ප්‍රේෂණ, ස්ථාවර නියෝග හා බැංකු ගාස්තු ව්‍යාපාරය විසින් සටහන් කරනු ලබන්නේ බැංකු ප්‍රකාශනය ලද පසුව වේ.

8. 2026 මාර්තු මාසයේ මුදල් ගිණුම සංශෝධනයට පෙර මුදල් ශේෂය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්විය යුතු මුදල් ශේෂයන් වන්නේ,

	සංශෝධනයට පෙර ශේෂය (රු)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්විය යුතු ශේෂය (රු)
(1)	(5 000)	17 000
(2)	17 000	5 000
(3)	35 000	17 000
(4)	5 000	17 000
(5)	35 000	47 000

(..........)

9. 2026.03.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වන්නේ, (රු)

(1) 5 000 (2) 8 000 (3) 17 000 (4) 20 000 (5) 37 000 (..........)

10. 2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා නිෂ්පාදන ව්‍යාපාරයක පහත සඳහන් තොරතුරු දක්නට ලැබුණි.

	(රු)
2025.03.31 අමුද්‍රව්‍ය තොගය	22 000
අමුද්‍රව්‍ය ගැනුම්	240 000
අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී	8 000
ඒකකයක් සඳහා සෘජු ද්‍රව්‍ය පිරිවැය	50
ඒකකයක් සඳහා සෘජු ශ්‍රම පිරිවැය	10
නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය	40 000
නොනිමි තොග වැඩිවීම	3 000

- නොනිමි තොග නිෂ්පාදන පිරිවැය මත අගය කිරීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තියයි.
- වර්ෂය තුළ නිෂ්පාදනය කළ ඒකක ප්‍රමාණය ඒකක 5 000 කි.

2026.03.31 දිනට අවසාන අමුද්‍රව්‍ය තොගය හා මුළු නිෂ්පාදන පිරිවැය වන්නේ,

	අමුද්‍රව්‍ය තොගය (රු)	මුළු නිෂ්පාදන පිරිවැය (රු)
(1)	18 000	337 000
(2)	20 000	337 000
(3)	20 000	420 000
(4)	22 000	420 000
(5)	28 000	400 000

(..........)

11. සිතුම් ගේ ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් පහත පරිදි වේ.

	2026.03.31 (රු.000)	2025.04.01 (රු.000)
වත්කම්	6 500	3 200
වගකීම්	1 500	700

2026.03.31 දිනට වත්කම් වල ඇතුළත් වී ඇති තොගය රු.200 000 කින් අධි තක්සේරුවී ඇති බව පසුව අනාවරණය විය. සිතුම්ගේ මුදල් ගැනිලි රු.10 000 ක්ද භාණ්ඩ ගැනිලි රු.8 000 ක් ද ඔහු සතු රු.150 000 ක් වටිනා පරිගණකය ව්‍යාපාරයට යෙදවීම නිවැරදිව ගිණුම්ගත කර ඇත.

2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා ශුද්ධ ලාභය වන්නේ, (රු'000)

(1) 1 168 (2) 2 168 (3) 2 300 (4) 2 368 (5) 3 768 (..........)

12. වෙළෙඳ ව්‍යාපාරයක 2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා පහත තොරතුරු දක්නට ලැබුණි.

	(රු.000)
2025.04.01 තොගය	500
2026.03.31 තොගය	300
මෙහෙයුම් පිරිවැය	2 800
විකුණුම්	12 000
ගැනුම්	8 400

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

ශුද්ධ ලාභ අනුපාතය පිරිවැයට 20% ක් වේ. හානි වූ තොග පිරිවැය වන්නේ, (රු'000)

(1) 1 100 (2) 1 300 (3) 1 500 (4) 1 600 (5) 1 800 (..........)

13. හවුල් ව්‍යාපාර සම්බන්ධ ප්‍රකාශ කිපයක් පහත දී ඇත.

A - හවුල් ආඥා පනතේ 24 වන වගන්තියට අනුව සියලු හවුල්කරුවන් ඔවුන්ගේ ප්‍රාග්ධනයට සමානුපාතිකව ලාභාලාභ බෙදා ගත යුතුය.

B - හවුල් ව්‍යාපාරයක සිටිය හැකි උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව 20 ක් බව හවුල් ආඥා පනත මගින් නියම කර ඇත.

C - හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධනය රු.1000 ට වඩා යොදවා ආරම්භ කරන විට ලිඛිත ගිවිසුමක් තබාගත යුතු බව 1840 අංක 7 දරන වංචා වැළැක්වීමේ පනත මගින් නියම කර ඇත.

D - ලිඛිත හවුල් ගිවිසුමක් නොමැති අවස්ථාවල නව හවුල්කරුවකු බඳවා ගැනීම සඳහා සිටින හවුල්කරුවන්ගේ 2/3 ක කැමැත්ත තිබිය යුතුය.

E - ඉවත්වන හවුල්කරුවන්ගේ හිමිකම් ණය ගිණුමකට මාරු කරන්නේ නම් එහි ශේෂය මත 5% ක වාර්ෂික පොළියක් ගෙවිය යුතු බව හවුල් ආඥා පනතේ 24 වන වගන්තිය නියම කර ඇත.

නිවැරදි ප්‍රකාශ/ප්‍රකාශය ඇතුළත් පිළිතුර වන්නේ,

(1) A, B, C (2) A, C, E (3) B, C, E (4) C පමණි (5) C, D, E (..........)

14. තිසර, මනුජ හා මන්දාර විසින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයේ 2026.03.31 දිනට පහත තොරතුරු දී ඇත.

ප්‍රාග්ධන ගිණුම්	ශේෂය (රු.000)
තිසර	3 500
මනුජ	2 000
මන්දාර	4 500

2026.03.31 දිනට ජංගම ගිණුම (රු.000)

	තිසර	මනුජ	මන්දාර		තිසර	මනුජ	මන්දාර
ගැනිලි	170	310		ශේෂය	320	410	200
				ප්‍රාග්ධන පොලී	350	200	450
				හවුල් වේතන	600	600	600
ශේෂය/ප/ගෙ	1 500	1 500	2 050	ලාභ කොටස්	400	600	800
	1 670	1 810	2 050		1 670	1 810	2 050

2026.03.31 දින මන්දාර ව්‍යාපාරයෙන් ඉවත්වේ. එදිනට හවුල්කරුවන් විසින් පහත එකඟතා ඇතිකර ගන්නා ලදී.

- ව්‍යාපාරයේ කීර්තිනාමය වටිනාකමක් නොමැත.
- මන්දරගේ හිමිකම් වලින් රු.1 000 000 ක් මුදලින් ගෙවීම
- ව්‍යාපාරයේ තිබූ 2026.03.31දිනට පිරිවැය රු.4 000 000 ක්ද සමුච්චිත ක්ෂය රු.1 260 000 ක් වූ මෝටර් රථයක් රු.2 560 000 කට එකග වූ අගයට පවරාදීම.
- ඉතිරි හිමිකම්, ණය ගිණුමකට මාරු කිරීම.
- ඉහත එකඟතා මෙතෙක් ගිණුම් ගත කර නැත.

මන්දාරගේ ණය ගිණුමට මාරු කරන වටිනාකම වන්නේ, (රු)

(1) 6 550 000 (2) 5 550 000 (3) 2 070 000 (4) 2 990 000 (5) 2 910 000 (..........)

15. ලිඛිත ගිවිසුමක් නොමැතිව හර්ෂ සහ නුවන් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයට 2026.03.31 දින නව හවුල්කරුවකු ලෙස චාමර බඳවා ගනී. එතැන් සිට ලාභාලාභ අනුපාතය 1:2:3 වශයෙන් එකඟ විය. ඔවුන්ගේ ප්‍රාග්ධන ගිණුම් වල පහත ශේෂ පැවතුණි.

	2026.03.31 (රු.000)	2025.04.01 (රු.000)
හර්ෂ	2 500	2 000
නුවන්	2 750	2 500
චාමර	5 250	?

චාමර රැගෙන ආ ප්‍රාග්ධනය වන්නේ, (රු)

(1) 750 000 (2) 1 500 000 (3) 6 000 000 (4) 5 250 000 (5) 500 000 (..........)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

- ප්‍රශ්න අංක 16 හා 17 සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

සීමිත ගගනි පොදු සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගණනය කළ මුළු විස්තිරණ ආදායම රු.4 570 000 ක් සහ වෙනත් විස්තිරණ ආදායම රු.1 220 000 ක් විය.

පසුව සිදු කළ අනාවරණය අනුව ව්‍යාපාරය සතු ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සම්බන්ධව පහත වැරදියි සිදු කර ඇති බව අනාවරණය කර ගන්නා ලදී.

- 2025.04.01 දිනට ඉඩම රු.2 520 000 ක අතිරික්තයක් සහිතව ප්‍රත්‍යාගණනය කරන ලදී. එම ඉඩම පෙර වසරේ සිදු කළ ප්‍රත්‍යාගණනය මගින් ඇතිවූ රු.900 000 ක ඌනතාවයක් ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනාගෙන තිබුණි. මෙම වසරේ ප්‍රත්‍යාගණන අතිරික්තය සම්පූර්ණයෙන්ම වෙනත් විස්තිරණ තුළ හඳුනාගෙන ඇත.
- 2026.03.31 දින ගොඩනැගිල්ල ඌනතාවයක් සහිතව ප්‍රත්‍යාගණනය කළ අතර එය සම්පූර්ණයෙන්ම වෙනත් විස්තිරණ ආදායම් තුළ දක්නට තිබුණි. නමුත් මෙම ගොඩනැගිල්ල පෙර වසරේදී සිදුකළ ප්‍රත්‍යාගණනයේදී රු.1100 000 ක අතිරික්තයක් වාර්තා කර තිබූ අතර ඉන් රු.800 000 ක් පෙර වසරේ වෙනත් විස්තිරණ ආදායම් තුළ නිවැරදිව ඇතුළත් කර තිබුණි.

16. 2026.03.31 දිනෙන් අවසන් වසරේ නිවැරදි වෙනත් විස්තිරණ ආදායම් වටිනාකම කොපමණද? (රු.000)
    (1) 1320 (2) 920 (3) 1220 (4) 1620 (5) 820 (...........)

17. 2026.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභය කොපමණද? (රු.000)
    (1) 3350 (2) 3870 (3) 3250 (4) 3750 (5) 3950 (...........)

18. නිෂ්පාදන සමාගමක් සතු තොග අයිතමයක් සම්බන්ධයෙන් 2026.03.31 දිනට ලබා ගත් තොරතුරු පහත දැක්වේ.
    - තොගය නිෂ්පාදනයට අදාළ සෘජු වියදම් රු.120 000
    - තොගයේ වක්‍ර නිෂ්පාදන වියදම් රු.30 000
    - තොගයේ ඇස්තමේන්තුගත විකුණුම් මිල රු.180 000
    - තොග විකිණීමේදී සිදුවන ඇස්තමේන්තුගත තැරැව්කාර ගාස්තු විකුණුම් මිලෙන් 10%
    - තොග විකිණිය හැකි තත්ත්වයට පත් කිරීම සඳහා තවදුරටත් දැරිය යුතු පිරිවැය රු.20 000

    LKAS 02 තොග ප්‍රමිතියට අනුව 2026.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු තොග අගය වන්නේ, (රු)
    (1) 180 000 (2) 170 000 (3) 170 000 (4) 142 000 (5) 130 000 (...........)

0146

19. LKAS 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශන ප්‍රමිතියට අනුව ව්‍යාපාරයක මුදල් හා මුදල් සමාන දෑ යටතේ වර්ග කළ හැකි අයිතමය/අයිතම නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
    A - සුළු මුදල් ඇතැති ශේෂය
    B - බැංකු ජංගම ගිණුමක පවතින බැර ශේෂය
    C - කල් පිරීමේ කාලය මාස 2 වන ස්ථාවර තැන්පතු
    D - කල් පිරීමේ කාලය මාස 4 වන භාණ්ඩාගාර බිල්පත්
    E - බැංකුවේ පවතින ඉතිරි කිරීමේ ගිණුම් ශේෂය

    (1) A, B හා E පමණි (2) A, B, D හා E පමණි (3) A, B, C හා E පමණි
    (4) A, C හා E පමණි (5) A, C, D හා E පමණි (...........)

20. සීමිත නිමල් පොදු සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන හිමිකම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2026.03.31 (රු.000)	2025.03.31 (රු.000)
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	1 700	1 000
ප්‍රත්‍යාගණන සංචිතය	60	20
පොදු සංචිතය	130	100
රඳවාගත් ඉපැයුම්	330	380

සමාගම විසින් 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී රු.200 000 ක සංචිත ප්‍රාග්ධනීකරණයක් රඳවාගත් ඉපැයුම භාවිතා කරමින් සිදුකර ඇති අතර හිමිකම් නිකුතුවක් ද සිදුකළ ඇත. එමෙන්ම සමාගම සතු ඉඩම ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කිරීම තුළින් ප්‍රත්‍යාගණන අතිරික්තයක් ලැබී ඇත.

2026.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගමේ කාලච්ඡේදයේ ලාභය සහ හිමිකම් නිකුතුවේ වටිනාකම පිළිවෙලින් දැක්වෙනුයේ,

	කාලච්ඡේදය ලාභය (රු)	හිමිකම් නිකුතුවේ වටිනාකම (රු)
(1)	150 000	700 000
(2)	180 000	700 000
(3)	180 000	500 000
(4)	220 000	500 000
(5)	220 000	700 000

(...........)

PAST PAPERS WIKI
www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers • Model Answers • Study Resources
Scanned with CamScanner

21. SLFRS - 15 ගනුදෙනුකරුවන් සමග ගිවිසුම් තුළින් ඇතිවන අයභාරය ප්‍රමිතය අනුව ව්‍යාපාරයක් විසින් අයභාරය හඳුනාගත යුතු ආකාරය පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) ගනුදෙනුකරු සමග ගිවිසුමකට එළඹුණු වහාම මුළු ගනුදෙනුවේ මිල ආදායම ලෙස හඳුනාගත යුතුය.
   (2) ගනුදෙනුකරුගෙන් අදාළ ගනුදෙනුව සඳහා මුදල් ලැබුණු අවස්ථාවේදී පමණක් ආදායම හඳුනාගත යුතුය.
   (3) නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ වහාම අපේක්ෂිත ලාභය ඇතුළු මුළු වටිනාකම ආදායම ලෙස හඳුනාගත යුතුය.
   (4) පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවාවල පාලනය ගැනුම්කරු වෙත පවරාදීමෙන් කාර්ය සාධන බැඳීම් ඉටු කරන විට ආදායම ලෙස හඳුනාගත යුතුය.
   (5) ගිවිසුමේ සඳහන් කාල සීමාව අවසන් වූ පසු පමණක් ආදායම හඳුනාගත යුතුය. (..........)

22. LKAS – 10 වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදුවීම් ප්‍රමිතියට අනුව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ කරන්න නිවැරදි වේද?
   A - වාර්තා කරන දිනට පැවති තත්ත්වයන් පිළිබඳ සාක්ෂි සපයන සිදුවීම්, නොගලපන සිදුවීම් ලෙස හඳුන්වයි.
   B - වාර්තා කරන දිනට පසුව සිදුවන සියලුම අවාසිදායක සිදුවීම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකළ යුතුය.
   C - වාර්තා කරන දිනට පසුව සිදුවන නමුත් එම දිනට පැවති තත්ත්වයන් මත පදනම් නොවන සිදුවීම් සඳහා මූල ප්‍රකාශනවල ගැලපීම් සිදුකළ යුතු නැත.
   D - මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීමට අනුමත කළ දිනට පසුව සිදුවන සිදුවීම් ද මෙම ප්‍රමිතය යටතේ සැලකිල්ලට ගත යුතුය.
   E - වාර්තා කරන කාලච්ඡේදයෙන් පසු කාලය යනු, ගිණුම් කාලච්ඡේදයේ අවසාන දිනයත් වාර්ෂික මහා සභා රැස්වීම පවත්වන දිනයත් අතර කාලය වේ.

   (1) C හා E පමණි (2) C හා D පමණි (3) B, C හා D පමණි
   (4) C පමණි (5) A, B හා E පමණි (..........)

- පහත තොරතුරු උපයෝගී කර ගනිමින් ප්‍රශ්න අංක 23 හා 24 සඳහා පිළිතුරු සපයන්න.
  සීමිත පසඳි සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

	2026.03.31 (රු.000)	2025.03.31 (රු.000)
වෙළඳ ලැබිය යුතු ශේෂය	180	220
වෙළඳ ගෙවිය යුතු ශේෂය	40	180
තොගය	150	50

- ව්‍යාපාරය සියලුම ගැනුම් සහ විකුණුම් ණය පදනම මත සිදුකරයි.
- වර්ෂය තුළ මුළු ණය ගැති ලැබීම්වල එකතුව රු.4 040 000 ක් සහ ණයහිමි ගෙවීම්වල එකතුව රු.2 640 000 කි.
- වර්ෂය තුළ මුළු වියදම් වල එකතුව රු.600 000 ක් වන අතර එහි ඇතුළත් මූල්‍ය වියදම්වල වටිනාකම රු.100,000 කි. මුළු වියදම් තුල ආදායම් බදු රු.200 000 ක් ඇතුලත් වේ.
- වර්ෂයකට දින 360 ක් වේ.

23. පසඳි සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයගැති පිරිවැටුම් අනුපාතය සහ තොග රැඳවුම් කාලය කොපමණද?

	ණයගැති පිරිවැටුම (වාර)	තොග රැඳවුම් කාලය (දින)
(1)	10	45
(2)	12	32
(3)	20	15
(4)	10	20
(5)	20	30

(..........)

24. පසඳි සමාගමේ පොලී ආවරණ අනුපාතය කොපමණද? (වාර)
   (1) 8 කි (2) 9 කි (3) 11 කි (4) 12 කි (5) 15 කි (..........)

25. කෙටි කාලීන පිරිවැය හැසිරීම සම්බන්ධව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) ධාරිතාව වෙනස් වීමට සාපේක්ෂව මුළු ස්ථාවර පිරිවැය සමානුපාතිකව වෙනස් වේ.
   (2) ධාරිතාව වෙනස් වීමට සාපේක්ෂව ඒකක විචල්‍ය පිරිවැය ක්‍රමානුකූලව වෙනස්වේ.
   (3) ධාරිතාවය ඉහළ යන විට ඒකකයක මුළු පිරිවැය ක්‍රමානුකූලව ඉහළ යයි.
   (4) ධාරිතාවය ඉහළ යන විට ඒකක ස්ථාවර පිරිවැය ක්‍රමානුකූලව පහළ යයි.
   (5) ධාරිතාවය වෙනස් වීමට සාපේක්ෂව ඒකකයක මුළු පිරිවැය වෙනස් නොවේ. (..........)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

26. සිමිත දෙව්නි පොදු සමාගමේ 2026 මාර්තු මස වැටුප් ලේඛනයෙන් සේවක වැටුප් සම්බන්ධව පහත තොරතුරු උපුටාගෙන ඇත.

	(රු.000)
සේවකයන්ට ගෙවූ ශුද්ධ වැටුප	2 300
සේවක ණය ආපසු අය කර ගැනීම	400

- ව්‍යාපාරය සේවකයන්ගේ දළ වැටුපෙන් EPF සඳහා 10% ක් අඩු කරන අතර සේව්‍යයා විසින් 15% ක් දායක වේ.
- මාසය තුළ දළ වැටුපෙන් අඩු කිරීම් සිදුකර ඇත්තේ සේවක ණය සහ සේවක අර්ථසාධක අරමුදල් වටිනාකම පමණි.

සිමිත දෙව්නි ව්‍යාපාරයේ 2026 මාර්තු මාසය සඳහා දළ වැටුප හා EPF වියදම කොපමණද?

	දළ වැටුප (රු.000)	EPF වියදම (රු.000)
(1)	3 000	300
(2)	3 300	450
(3)	3 000	750
(4)	3 300	300
(5)	3 000	450

(..........)

27. පොදු කාර්ය පිරිවැය සම්බන්ධව නිවැරදි ප්‍රකාශය ඇතුළත් පිළිතුර කුමක්ද?

A - ස්ථාවර පොදු කාර්ය පිරිවැය නිෂ්පාදිතයට අදාළව පැහැදිලිව වෙන්කර හඳුනාගත හැකිය.
B - පොදු කාර්ය පිරිවැය නිෂ්පාදිතයට ඇතුළත් කිරීම පොදු කාර්ය පිරිවැය ප්‍රතිපාදනය වේ.
C - පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කිරීම සඳහා යොදාගත හැක්කේ යන්ත්‍ර පැය පදනම හෝ ශ්‍රම පැය පදනම පමණි.
D - ප්‍රතිපාදනය නොකළ පොදු කාර්ය පිරිවැය සුදුසු පදනමක් භාවිතා කරමින් පිරිවැය මධ්‍යස්ථාන අතර විභජනය කළ යුතුය.
E - සේවා පිරිවැය මධ්‍යස්ථානවලට බෙදාහරණ ලද පොදු කාල පිරිවැය නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන අතර බෙදා හැරීම ද්විතික විභජනය වේ.

(1) A හා C පමණි (2) B හා D පමණි (3) A, C හා D පමණි
(4) C, D හා E පමණි (5) D හා E පමණි (..........)

- පහත තොරතුරු උපයෝගී කර ගනිමින් ප්‍රශ්න අංක 28 හා 29 සඳහා පිළිතුරු සපයන්න.

කුසල ව්‍යාපාරය තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරයි. එහි පහත ක්‍රියාකාරී මට්ටම්වල තොරතුරු සපයා දී ඇත.

	ඒකක 2000	ඒකක 4000
මුළු පිරිවැය (රු)	500 000	700 000

- දායක විකුණුම් අනුපාතය 60% කි.
- ක්‍රියාකාරී මට්ටම ඒකක 5000 ඉක්මවන විට රු.100 000 ක අතිරේක ස්ථාවර පිරිවැයක් දැරිය යුතුවේ.

28. ඉහත කුසල ව්‍යාපාරය සමච්ඡේද ඒකක ප්‍රමාණය කොපමණද?

(1) 1 000 (2) 2 000 (3) 3 000 (4) 4 000 (5) 5 000 (..........)

29. ඒකක 6 000 ක් නිෂ්පාදනය කරන්නේ නම් ලාභය හෝ අලාභය කොපමණද? (රු)

(1) 300 000 (2) 400 000 (3) 500 000 (4) 600 000 (5) 700 000 (..........)

30. ප්‍රාග්ධන ආයෝජන තීරණය සම්බන්ධව නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ ඇතුළත් පිළිතුර කුමක්ද?

A - පිළි ගෙවුම් කාලය වැඩිම ව්‍යාපෘතිය තෝරාගත යුතුය.
B - ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය ගණනය කිරීමේදී සැලකිල්ලට ගනු ලබන්නේ මුදල් ප්‍රවාහයන් වේ.
C - ශුද්ධ වර්තමාන අගය ගණනය කිරීමේදී වත්කමෙහි සුන්බුන් අගය සැලකිල්ලට ගනී

(1) A පමණි (2) B පමණි (3) C පමණි
(4) B හා C පමණි (5) A, B හා C යන සියල්ලම (..........)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

**** 31 සිට 50 තෙක් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න ****

31. මූල්‍ය ගිණුම්කරණය සහ කළමනාකරණ ගිණුම්කරණ වාර්තා අතර වෙනස්කම් පහත කරුණු මත දක්වන්න.

	මූල්‍ය ගිණුම්කරණය	කළමනාකරණ ගිණුම්කරණය
A යොදා ගන්නා තොරතුරු වල ස්වභාවය	....	....
	....	....
B නෛතික අවශ්‍යතාවය	....	....
	....	....

32. දූලංකා ව්‍යාපාරයේ කාලච්ඡේදයට අදාළ රක්ෂණ වියදම රු.50 000 කි. රක්ෂණ වියදම් වෙනුවෙන් ගිණුම් කාලච්ඡේදය තුළ මුදල් ගෙවීමක් සිදු නොවුණි. මෙම ගනුදෙනුව නිසා ව්‍යාපාරයේ පහත අයිතිම වැඩිවේද අඩුවේද යන්න දක්වන්න.

(1) වගකීම් වැඩි වේ/ අඩුවේ - ....

(2) ශුද්ධ වත්කම් වැඩිවේ/ අඩුවේ - ....

33. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පහත එක් එක් ගනුදෙනු සටහන් කිරීමට භාවිතා කරනු ලබන මූලික සටහන් පොත සඳහන් කරන්න.

	ගනුදෙනුව	මූලික සටහන් පොත
A	මහණ මැෂින් ක්ෂයවීම රු.25 000	....
B	රෙදි මීටර් 500 ක් හානි වීම	....
C	නිමි ඇඳුම් 1 000 ක් ධ්‍රස්මෝ සමාගමට විකිණීම	....
D	රෙදි මීටර 10 000 ක් ණයට ගැනීම	....

34. ඉමල්ෂාගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

2025.01.01	සෙහංසාගෙන් ගැනුම්	රු.200 000
2025.02.10	නෙතුම්ගෙන් ගැනුම්	රු.50 000

- සියළු ගැනුම් මත 18% ක VAT එකතු කල යුතු අතර VAT රහිත මිල ඉහත දී ඇත.

(අ). ඉමල්ෂාගේ ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී නොමැති නම්, මෙම ගනුදෙනුව පොදු ලෙජරයට පිටපත් කිරීමේ ද්විත්ව සටහන ලියා දක්වන්න.

....
....
....
....

(ආ). ඉමල්ෂාගේ ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී ඇත්නම් මෙම ගනුදෙනුව පොදු ලෙජරයට පිටපත් කිරීමේ ද්විත්ව සටහන ලියන්න.

....
....
....
....
....

35. පහත සඳහන් අයිතම අයත්වන මූල්‍ය ප්‍රකාශන වල මූලිකාංගය ලියා දක්වන්න.

	ගිණුම	ගිණුම්කරණ මූලිකාංගය
1	ගැනුම් ගිණුම	....
2	ක්ෂය ගිණුම	....
3	විකුණුම් අත්තිකාරම් ගිණුම	....
4	ආපසු එවුම් ගිණුම	....

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
Scanned with CamScanner

36. (අ). සීමිත රශ්මික පොදු සමාගම 2025.04.01 දින කල්බදු ගෙවීම් වල වර්තමාන අගය රු.6 000 000 ක් ද ඵලදායී ජීව කාලය අවුරුදු 6 ක්ද කල්බදු කාලය අවුරුදු 4 ක්ද වන මෝටර් රථයක් කල්බදු ක්‍රමයට ගනී. 2026.03.31 දින මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු මෙම මෝටර් රථයේ ධාරණ අගය සහ මෙයට අදාළ කරගෙන ඇති ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

....

(ආ). සීමිත සඳුනි පොදු සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂයේ අත්පිට මුදලට විකුණුම් රු.7 200 000 ක්ද, ණයට විකුණුම් රු.1 400 000 ක්ද, විකුණුම් අත්තිකාරම් ලෙස රු.300 000 ක්ද ලැබී ඇත. ආදායම් ප්‍රකාශයේ හඳුනාගත යුතු විකුණුම් වටිනාකම සහ ඊට අදාළ ගිණුම්කරණ සංකල්පය දක්වන්න.

....

37. දිප්ති ක්‍රීඩා සමාජයේ 2026.03.31 දිනට සාමාජිකයන් 87 දෙනෙකු සිටින අතර මාසික සාමාජික මුදල රු.400 කි. මින් සාමාජිකයන් 15 දෙනෙකු 2025.12.01 දිනද, සාමාජිකයන් 12 දෙනෙකු 2025.08.01 දිනද, සංගමයට බැඳී ඇත. මෙම ක්‍රීඩා සමාජය 2025.04.01 ආරම්භ කළ අතර සංගමයට බැඳෙන දිනයේදී වර්ෂයකට සාමාජික මුදල් සෑම සාමාජිකයෙක්ම ගෙවිය යුතුය. ආදායම් ප්‍රකාශයේ දැක්විය යුතු සාමාජික මුදල් ආදායම කීයද?

....
....
....
....
....

- පහත තොරතුරු උපයෝගී කරගෙන ප්‍රශ්න අංක 38 හා 39 සඳහා පිළිතුරු සපයන්න.

දෙව්නි සහ දම්ෂි විසින් 3:1 අනුපාතයට පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට 2026.03.31 දින දැහැමි බඳවා ගැනීමට පෙර හා පසු ප්‍රාග්ධන ගිණුම් ශේෂ පහත දී ඇත.

	දෙව්නි (රු.000)	දම්ෂි (රු.000)	දැහැමි (රු.000)
දැහැමි බඳවා ගැනීමට පෙර ප්‍රාග්ධන ගිණුම් ශේෂ	12 000	8 000	-
දැහැමි බඳවා ගැනීමට පසු ප්‍රාග්ධන ගිණුම් ශේෂ (සියළු ගැලපීම් කළ පසු)	13 400	7 400	13 200

- දැහැමි විසින් මුදලින් රු.5,000,000 ක මුදලක් සහ රු.9,000,000 ක මෝටර් රථයක් ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරන ලදී.
- දැහැමි බඳවා ගත් පසුව දෙව්නි, දම්ෂි සහ දැහැමි විසින් ලාභ හෝ අලාභ පිළිවෙලින් 2:2:1 අනුපාතයට බෙදා ගැනීමට එකඟ වී ඇත.
- වර්ෂය තුළ දම්ෂි විසින් රු.2,000,000 ක යන්ත්‍රයක් ව්‍යාපාරයට ලබා දී ඇති අතර ඒ පිළිබඳව ගිණුම්ගත කර නොතිබුණි.

38. දැහැමි බඳවා ගත් දිනට ආගනනය කළ කීර්තිනාමය කොපමණද? (රු.000) ....

39. 2025.04.01 දිනට හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකම රු.21,200,000 ක් ද, වර්ෂය තුළ ඉපයූ ලාභය රු.5,300,000 ක් ද, නම් හා වර්ෂය තුළ හවුල්කරුවන් විසින් ගැනිලි සිදුකර නොමැති නම් 2026.03.31 දිනට මුළු ජංගම ගිණුම් ශේෂ වල එකතුව කොපමණද? (රු.000) ....

40. මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්පනාත්මක අනුව මූල්‍ය ප්‍රකාශන වල මූලිකාංග ගිණුම්කරණය කළ හැකි ක්‍රම නම් කරන්න.

(1) ....

(2) ....

41. පහත ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

(1) ආයතනයේ සියලුම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙළ කළ යුතුය. (.............)

(2) ගිණුම්කරණ ප්‍රමිතියකින් ඉඩ දී ඇති අවස්ථාවකදී හැර වත්කම් සහ වගකීම් හෝ ආදායම් සහ වියදම් හිලව් කිරීම නොකළ යුතුය. (.............)

(3) මුළු විස්තීරණ ආදායම යනු කාලච්ඡේදයක හඳුනාගත් මුළු ආදායම් සහ මුළු වියදම් අතර වෙනසයි. (.............)

(4) ගිණුම්කරණ සටහන් මූල්‍ය ප්‍රකාශන කට්ටලයක සංරචකයන්ට අයත් නොවේ. (...........)

0144

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

42. LKAS 37 ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතියට අනුව සත්‍ය ප්‍රකාශන ඇතුළත් අක්ෂර නම් කරන්න.

A - ගනුදෙනුකරුවකු වෙත ලබාදෙන වගකීම් සහතිකයක් මත ඇතිවන බැඳීම, සම්මුතික බැඳීමකි.

B - අනාගතයේ ඇතිවිය හැකි මෙහෙයුම් අලාභයක් සඳහා ප්‍රතිපාදනයන් හඳුනාගත හැකිය.

C - වර්තමාන බැඳීමක් ඇතත් බැඳීමේ වටිනාකම විශ්වාසදායි ලෙස ඇස්තමේන්තු කළ නොහැකි විට එය ප්‍රතිපාදනයක් ලෙස හඳුනාගත නොහැක.

D - අසම්භාව්‍ය වත්කමක් වුවද ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමක් අපේක්ෂා කරන්නේ නම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වත්කම් ලෙස හඳුනාගත හැකියි.

....

43. සීමිත මධුර සමාගමේ කල්බදු ක්‍රමයට ලබාගත් යන්ත්‍රයක් සම්බන්ධව පහත තොරතුරු ලබා දී ඇත.

2026.04.01 මූලික ගෙවීම රු.200 000

2026.04.01 දරන ලද සෘජු පිරිවැය රු.100 000

රු.600 000 බැගින් ගෙවිය යුතු කල්බදු වාරික ගණන 04

කල් බද්දේ ගම්‍ය පොලී අනුපාතය 10% කි. එහි වට්ටම් සාධකය පහත දැක්වේ.

වර්ෂය	1	2	3	4
වට්ටම් සාධකය	0.9	0.8	0.7	0.6

SLFRS 16 කල්බදු ප්‍රමිතය අනුව,

(අ) 2026.04.01 මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු භාවිත අයිතිය සහිත වත්කමේ වටිනාකම කොපමණද?
....

(ආ) එදිනට හඳුනාගත යුතු කල්බදු වගකීම කොපමණද? ....

44. ගැමුණු පොදු සමාගම ඡායා පිටපත් යන්ත්‍ර අලෙවි කරනු ලබයි. එසේම සමාගම අලෙවි කරන ලද යන්ත්‍රයකට නඩත්තු සේවා ද සපයනු ලබයි.2026.03.01 දින සමාගම ඡායා පිටපත් යන්ත්‍රයක් විකිණීම සහ වසරක නඩත්තු කර සේවා සැපයීමට ගනුදෙනුකරුවකු සමග ගිවිසුමකට එළඹුණි. ගිවිසුමේ පරිදි යන්ත්‍රය 2026.03.31 දින ගනුදෙනුකරුට භාර දී ඇත. ගිවිසුමේ ප්‍රතිෂ්ඨාව රු.650 000 ක් වූ අතර ඒ සඳහා 2026.03.01 දිනට චෙක්පතක් ලැබිණි. සමාගම ඡායාපිටපත් යන්ත්‍රය පමණක් විකිණීමේදී එය රු.600 000 කටද නඩත්තු සේවා සැපයීම වෙනම කරන්නේ නම් වසරක් සඳහා රු.200 000 ක් ද අය කරනු ලබයි. මේ අනුව,

(අ) 2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා හඳුනාගත යුතු අයභාරය කොපමණද?
....

(ආ) 2026.03.31 දිනට නොඉපයූ අයභාරය කොපමණද? ....

45. ගිණුම්කරණ අනුපාත සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ ඇතුළත් අක්ෂර නම් කරන්න.

A - ව්‍යාපාරයක දිගු කාලීන නුබුන්වත් භාවය ගණනය කිරීම දහා ක්‍රියාකාරී අනුපාතය භාවිතා කරයි.

B - තෝලන අනුපාතය හෙවත් මූල්‍ය ස්ථාවරත්වා අනුපාත ගණනය කිරීමට දත්ත ලබාගත යුත්තේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් පමණි.

C - මුලු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය ගණනය කිරීමේදී, බදු සහ පොලී හෝ පෙර ලාභය සැලකිල්ලට ගනී.

D - තොග පිරිවැටුම් අනුපාතේ ඉහළ යන විට තොග රැඳවුම් කාලය පහළ යයි.

E - ණය අනුපාතය 50% කට වඩා ඉහළ අගයක් ගනී නම් ව්‍යාපාරයේ අධි තෝලන තත්ත්වයක් පවතී.

....

46. පහත සඳහන් එක් එක් ප්‍රකාශ සත්‍ය අසත්‍ය බව දක්වන්න.

(1) කළමනාකරණ ගිණුම්කරණයේදී ගිණුම්කරණ ක්ෂේත්‍රය හැර වෙනත් විෂයන්ද භාවිතයට ගෙන තොරතුරු සපයයි. (................)

(2) තීරණ ගැනීම සඳහා පිරිවැය වර්ග කරනුයේ නිෂ්පාදන පිරිවැය හා කාලච්ඡේද පිරිවැය ලෙසයි. (................)

(3) නිෂ්පාදන ඒකකයක විචල්‍ය පිරිවැය ස්ථාවර වේ. (................)

(4) ආයතනයක් විසින් විවිධ නිෂ්පාදන හා සේවා අංශවලට අවශ්‍ය භාණ්ඩ ඉල්ලුම් කරමින් සැපයුම් අංශයට එවනු ලබන්නේ ද්‍රව්‍ය අධියාචනා පත්‍රයයි. (................)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
Scanned with CamScanner

47. නිලූ නිෂ්පාදන ආයතනය විසින් තම නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරන අමුද්‍රව්‍යයක මාසික අවශ්‍යතාවය ඒකක 6,000 ක් වේ. එම අමුද්‍රව්‍ය ඒකකයක් මිලදී ගැනීමේ මිල රු.200 ක් වන අතර එක් ඇනවුමක් ලබාදීම සඳහා වැය වන පිරිවැය රු.200 කි. තොග පවත්වාගෙන යාමේ පිරිවැය ඒකක මිලෙන් 10% ක් ලෙස තක්සේරු කර ඇත.

(අ) ඉහත දත්තයන්ට අනුව මෙම ආයතනයේ ආර්ථික ඇනවුම් ප්‍රමාණය කොපමණද?

....

(ආ) වර්ෂයක් තුළදී සිදු කරන ඇනවුම් වාර ගණන කොපමණද? ....

48. පවනි නිෂ්පාදන ව්‍යාපාරයේ භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සම්බන්ධ පහත තොරතුරු අදාළ වේ.

- උපරිම පරිභෝජනය දිනකට 500kg
- අවම පරිභෝජනය දිනකට 200kg
- සාමාන්‍ය පොරොත්තු කාලය සති 4
- උපරිම පොරොත්තු කාලය සති 6
- ආර්ථික ඇනවුම් ප්‍රමාණය 20 000kg

පහත දෑ ගණනය කරන්න.

(අ) උපරිම තොග මට්ටම ....

(ආ) යළි ඇනවුම් මට්ටම..

49. ඉසිරි ව්‍යාපාරය නව භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරයි. එහි විකුණුම් ධාරිතා මට්ටම 2 කට අදාලව පහත තොරතුරු සපයා ඇත.

- ඒකක 2 000 දී අලාභය රු.200 000 කි.
- ඒකක 3 000 දී ලාභය රු.800 000 කි.
- ඒකක විකුණුම් මිල රු.1 000 කි.

පහත දෑ ගණනය කරන්න.

(අ). ඒකක දායකය - ....

(ආ). ඒකක 5000 කදී ලාභය කොපමණද? - ....

50. සමාගමක් විසින් යන්ත්‍රයක් මිලදී ගැනීම සලකා බලමින් සිටි. අදාල තොරතුරු පහත දී ඇත.

	(රු.000)
යන්ත්‍රය පිරිවැය	10 000
කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය	2 000
වාර්ෂික ශුද්ධ මෙහෙයුම් මුදල් ගලා ඒම්	3 000
යන්ත්‍රයේ සුන්බුන් අගය	1 000

යන්ත්‍රය ඵලදායී ජීව කාලය අවුරුදු 5 ක් වන අතර ඵලදායී ජීව කාලය අවසානයේ කාරක ප්‍රාග්ධන ය නැවත අය කර ගත හැකිවේ. යන්ත්‍රය සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි.
පහත දෑ ගණනය කරන්න.

(අ) යන්ත්‍රයේ පිලි ගෙවුම් කාලය - ....

(ආ) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය - ....

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
Scanned with CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2026
தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2026 / Grade 13 Final Term Test - 2026

ගිණුම්කරණය - II

33 | S | II

කාලය / நேரம் / Time } පැය 3 යි, අමතර කියවීම් කාලය මි. 10 යි

නම / பெயர் / Name } .... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ....

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න. වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

0191

උපදෙස්:

* පළමු වන හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකයට පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
* අදාළ පෙර වැඩ පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 200 ක් හිමි වේ.

1. සීමිත දෙව්නි පොදු සමාගම මුද්‍රණ යන්ත්‍ර නිෂ්පාදනය කර අලෙවි කරන සමාගමකි. එම සමාගමේ 2026.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම පහත දී ඇත..

විස්තරය	හර (රු.'000)	බැර (රු.'000)
දේපළ පිරියත හා උපකරණ	133 000	
දේපළ පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය 2025.04.01 දිනට		13 000
විකුණුම් පිරිවැය	32 000	
අයභාරය		86 000
තොග	5 000	
වෙළඳ ලැබිය යුතු දෑ	3 400	
වෙළඳ ගෙවිය යුතු දෑ		1 200
මුදල් හා මුදල් සමාන දෑ	7 000	
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටස් 800 000)		80 000
ප්‍රත්‍යාගණන සංචිත		1 600
රඳවාගත් ඉපැයුම් (2025.04.01 දිනට)		26 060
බෙදා හැරීමේ වියදම්	12 000	
පරිපාලන වියදම්	6 000	
වෙනත් වියදම්	1 300	
මූල්‍ය වියදම්	2 200	
ගෙවූ ආදායම් බදු	1 960	
ආදායම් බදු වෙන්කිරීම (2025.04.01 දිනට)		200
වගකීම් සහතික මත ප්‍රතිපාදන (2025.04.01 දිනට)		800
භාවිත අයිතිය සහිත මෝටර් රථ	5 000	
	208 860	208 860

2026/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පහත තොරතුරු සැළකිල්ලට ගත යුතුය.

iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

(i) 2025/03/31 දිනට භෞතිකව ආගණනය කළ තොගයේ සංයුතිය පහත දී ඇත.

	(රු.000)
අමුද්‍රව්‍ය	1,800
නොනිමි	800
නිමි	2,400

- මෙම තොගය භෞතිකව ආගණනය කිරීමේදී අමුද්‍රව්‍ය තොගය තුළ රු.300,000 ක් වූ නිමි භාණ්ඩ තොග ඇතුළත් වී ඇති බව අනාවරණය කරගෙන ඇත.
- නිමි තොග එහි ශුද්ධ උපලබ්ධි වටිනාකම රු.2,000,000 ක් බව ඇස්තමේන්තු කර තිබුණි.
- එමෙන්ම නොනිමි තොගය සඳහා තවත් රු.200,000 ක නිෂ්පාදන වියදමක් දැරීමෙන් අනතුරුව රු.1,250,000 කට අලෙවි කළ හැකි බවට ඇස්තමේන්තු කර තිබුණි. එම නොනිමි තොගය අලෙවි කිරීම සඳහා රු.300,000 ක විකුණුම් වියදම් දැරිය යුතුය.

(ii) කර්මාන්ත ශාලාවේ විදුලි ගාස්තු රු.600,000 ක් සහ විගණන ගාස්තු රු.300,000 ක් බෙදාහැරීමේ වියදම් තුළ දක්වා තිබුණි.

(iii) ශේෂ පිරික්සුම තුළදී ඇති දේපළ පිරියත සහ උපකරණවල සංයුතිය පහත පරිදි වේ.

අයිතමය	2025.04.01 දිනට පිරිවැය (රු.000)	2025.04.01දිනට සමුච්චිත ක්ෂය (රු.000)
ඉඩම්	56 000	
ප්‍රදර්ශනාගාර ගොඩනැගිල්ල	42 000	6 000
නිෂ්පාදන පිරියත	25 000	5 000
කාර්යාල උපකරණ	10 000	2 000
	133 000	13 000

- ප්‍රදර්ශනාගාර ගොඩනැගිල්ලෙහි ඵලදායී ජීව කාලය වර්ෂ 20ක් සහ සුන්බුන් අගය රු.2,000,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. 2025.04.01 දින සිදුකළ සමාලෝචනයකට අනුව මෙම ගොඩනැගිල්ලෙහි මුළු ඵලදායී ජීව කාලය වර්ෂ 13 ක් බවත් සුන්බුන් අගය රු.6,000,000 ක් ලෙසත් ඇස්තමේන්තු වී ඇත.
- 2025.10.01 දින සිදු වූ ගින්නකින් පිරිවැය රු.5,000,000 ක් වූ නිෂ්පාදන පිරියතයක් ගිනිගෙන තිබූ අතර ඒ සඳහා රු.3,600,000 ක වන්දි ගෙවීමට 2026.04.03 දින රක්ෂණ සමාගම එකඟ වී තිබුණි. ව්‍යාපාරය නිෂ්පාදන පිරියත, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරයි. ගින්නෙන් හානි වූ පිරියත මිලට ගෙන තිබුණේ 2023.10.01 දින වේ.
- කාර්යාල උපකරණ 2025.04.01 දින රු.6,000,000 කට ප්‍රත්‍යාගණනය කළ අතර කාර්යාල උපකරණ මිලදී ගන්නා අවස්ථාවේදී ඒ ඵලදායී ජීව කාලය වර්ෂ 10 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි.

(iv) භාණ්ඩ බෙදා හැරීමේ කටයුතු සඳහා 2025.04.01 මෝටර් රථයක භාවිත අයිතිය ලබාගැනීමට අදාළව පහත තොරතුරු දී ඇත.

	(රු.000)
මූලික ගෙවීම	3 000
වාරික ගෙවීම් වල වර්තමාන අගය	7 000
මූලික පසු පිරිවැය ගෙවීම	2 000

- ඒ සඳහා ගෙවූ මූලික ගෙවීම හා මූලික ඍජු පිරිවැය සඳහා ගෙවීම් පමණක් ගිණුම් ගත කර තිබුණි. කල්බද්දෙහි ගම්‍ය පොලී අනුපාතිකය 10% කි. 2026.03.31 දිනෙන් ආරම්භ වී රු.2,000,000 බැගින් වූ සමාන වාරික 5 කින් කල්බදු වගකීම පියවිය යුතු අතර 2026.03.31 දිනට ගෙවිය යුතු කල්බදු වාරිකය ගෙවා නොතිබුණි. කල්බදු කාලය අවසානයේදී මෙම රථයෙහි අයිතිය කල්බදු ගැනුම්කරුට හිමිවන අතර මෙම රථයෙහි ඵලදායී ජීව කාලය වර්ෂ 10 ක් ලෙසත් එහි සුන්බුන් අගය රු.2,000,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි.

(v) ශේෂ පිරික්සුමෙහි ඇති ගෙවූ ආදායම් බදු තුළ පෙර වර්ෂය සඳහා ගෙවූ රු.160,000 ක් ඇතුළත්ය. ප්‍රවර්තන වර්ෂයේ සඳහා ඇස්තමේන්තුගත ආදායම් බදු වියදම ලෙස රු.1,540,000 ක් දක්වා තිබුණි.

(vi) 2025.10.01 දිනට පැවති සෑම සාමාන්‍ය කොටස් 10 කටම 1 බැගින් කොටසක් රු.100 ක ප්‍රතිෂ්ඨාවක් යටතේ හිමිකම් නිකුතුවක් කළ අතර ඒ සඳහා නියමිත පරිදි මුදල් ලැබී තිබුණි. එය විකුණුම් ගිණුමේ සටහන් කර ඇත.

(vii) 2026.03.31 දින වන විට වගකීම් සහතික මත අලුත්වැඩියා වියදම් සඳහා ගෙවූ රු.860,000 ක මුදලක් බෙදාහැරීමේ වියදම් තුළ දක්වා තිබුණි. 2026.03.31 දිනට වගකීම් සහතික මත ප්‍රතිපාදන ගිණුමේ ශේෂ රු.1,220,000 ක් වන පරිදි ගැලපිය යුතුය.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

(viii) 2026.03.31 දිනට අධ්‍යක්ෂක මණ්ඩලය මගින් පහත තීරණ ගෙන තිබුණි.

- 2026.03.31 දිනට පැවැති සෑම සාමාන්‍ය කොටස් 20 කටම 1 ක් වන පරිදි රදවාගත් ඉපයුම් ප්‍රාග්ධනීත කිරීම.
- 2026.03.31 දිනට පවතින සෑම සාමාන්‍ය කොටසක් සඳහාම රු.8 බැගින් ලාභාංශ ගෙවීමට යෝජනා කිරීම

අවශ්‍ය වන්නේ :

LKAS 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමිතයට අනුව, ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත දෙව්නි පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන්ද සහිතව)

(1) 2026/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2026/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(3) 2026/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම වෙනස් වීමේ ප්‍රකාශනය

(මුළු ලකුණු 40)

2. (අ). සීමිත නෙත්ම සමාගමේ නිෂ්පාදන ඒකකයක් නිපදවීමට අවශ්‍ය වන අමුද්‍රව්‍ය වර්ග දෙකක් සම්බන්ධව පහත තොරතුරු සපයා ඇත.

	අමුද්‍රව්‍ය වර්ග 1 RM 1	අමුද්‍රව්‍ය වර්ග 2 RM 2
වර්ෂයකට අවශ්‍ය ඒකක ගණන	60 000 kg	80 000 kg
ඒකකයක ගැනුම් මිල	රු.2 000	රු.1 000
එක් ඇනවුමක පිරිවැය	රු.7 500	රු.5 000
උපරිම පරිභෝජනය දිනකට	250 kg	300 kg
අවම පරිභෝජනය දිනකට	100 kg	200 kg
උපරිම ඇණවුම් කාලය සති	4	3
අවම ඇණවුම් කාලය සති	2	1

- ඒකකයක් වර්ෂයක් ගබඩා කර තබා ගැනීම සඳහා ඒකක පිරිවැයෙන් 5% ක් වැය වේ.

අවශ්‍ය වන්නේ :

RM 1 හා RM 2 නැමැති අමුද්‍රව්‍ය වර්ග සඳහා පහත දෑ ගණනය කරන්න.

(1) ආර්ථික ඇනවුම් ප්‍රමාණය

(2) උපරිම තොග මට්ටම

(3) අවම තොග මට්ටම

(4) වර්ෂයකට සිදු කළ යුතු ඇනවුම් වාර ගණන

(ලකුණු 10)

(ආ). සීමිත හශේන් පොදු සමාගම P හා Q ලෙස වර්ග දෙකක භාණ්ඩ නිෂ්පාදනය කරයි. මෙම භාණ්ඩ එකලස් සහ නිමැවුම් ලෙස නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් හරහා ගමන් කරයි. එම නිෂ්පාදන දෙපාර්තමේන්තු සඳහා අවශ්‍ය සේවා සැපයීමට නඩත්තු අංශය ලෙස සේවා දෙපාර්තමේන්තුවක්ද පිහිටා ඇත.

P භාණ්ඩය ඒකක 3000 ක් සහ Q භාණ්ඩය ඒකක 2000 ක් නිපදවීම සඳහා අයවැය ගත පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය ගණනය කරන ලද අතර ඒවා පහතදී ඇත.

එකලස් දෙපාර්තමේන්තුව - යන්ත්‍ර පැයකට රු.50

නිමැවුම් දෙපාර්තමේන්තුව - ඍජු ශ්‍රම පැයකට රු.40

ඉහත පොදු කාර්ය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කිරීමේදී පහත දැක්වෙන වැරදි හා මගහැරීම් සිදුවී ඇති බව පසුව අනාවරණය කර ගන්නා ලදී.

(i) පරිපාලන වේතන රු.160 000 ක් එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තු අතර සේවක සංඛ්‍යාව පදනම් කරගෙන විභජනය කර ඇත.

(ii) නඩත්තු අංශයේ මුළු පොදු කාර්ය පිරිවැය රු.100,000 ක් වැඩිවී ඇති අතර එය එකලස් නිමවුම් අංශ අතර ද්‍රව්‍ය අධියාචනාපත්‍ර වටිනාකම මත විභජනය කර තිබුණි.

(iii) එකලත් අංශයේ වක්‍ර ද්‍රව්‍ය පිරිවැය රු.180 000 ක් සටහන් කර නොතිබූ අතර නිමැවුම් අංශයේ වක්‍ර ශ්‍රම පිරිවැය රු.20 000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(iv) පහත දැක්වෙන නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය අයිතම ද මගහැරී තිබුණි.

- යන්ත්‍ර රක්ෂණ වියදම් රු.150 000
- විදුලි ගාස්තු රු.120 000
- ගොඩනැගිලි කුලිය රු.280 000

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(v) එකලස්, නිමැවුම් සහ නඩත්තු අංශයේ පහත තොරතුරු සපයා ඇත.

	එකලස්	නිමැවුම්
භාවිතා කරන විදුලි ඒකක (කිලෝ වොට් පැය)	5 000	7 000
යන්ත්‍ර පිරිවැය (රු.000)	2 000	1 000
භූමි ප්‍රමාණය (වර්ගමීටර)	16 000	12 000
ද්‍රව්‍ය අධියාචනා පත්‍ර වටිනාකම (රු.000)	1800	1 200
යන්ත්‍ර පැය	35 000	12 000
සෘජු ශ්‍රම පැය	20 000	28 000
සේවක සංඛ්‍යාව	20	20

(vi) P හා Q භාණ්ඩ ඒකකයක් නිපදවීමට එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තුවල ගත කළ යුතු කාලය පිළිබඳ තොරතුරු පහතදී ඇත.

	P	Q
එකලස් දෙපාර්තමේන්තුව - යන්ත්‍ර පැය	3	2
නිමැවුම් දෙපාර්තමේන්තුව - ශ්‍රම පැය	2	4

(vii) P හා Q භාණ්ඩ නිෂ්පාදනය කිරීමට පිළිවෙලින් රු.530 ක සහ රු.700 ක ප්‍රාථමික පිරිවැයක් දැරිය යුතුය.

(viii) සමාගම සෑම නිෂ්පාදිතයක්ම විකුණුම් මිල මත 20% ක ලාභයක් සහිතව අලෙවි කරයි.

අවශ්‍ය වන්නේ :

(1) විභජනය පදනම පැහැදිලිව දක්වමින් සංශෝධිත පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

(2) එකලස් සහ නිමැවුම් අංශ සඳහා සංශෝධිත පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය

(3) P හා Q භාණ්ඩ ඒකකයක නිෂ්පාදන පිරිවැය

(4) මෙම ක්‍රියාකාරී මට්ටමේදී ආයතනයේ ලාභය.

(ලකුණු 30)

(මුළු ලකුණු 40)

3. (අ). සීමා සහිත රුහුණුපුර හුඩ සිටි පෞද්ගලික සමාගම එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇති ආයතනයකි. 2025.04.30 දිනට, එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දැක්වේ.

විස්තරය	රු.මිලියන
දේපළ පිරියත ධාරණ වටිනාකම	500
තොගය	300
වෙළඳ ලැබිය යුතු දෑ	50
මුදල් මුදල් සමාන දෑ	80
මුළු වත්කම	930
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	450
රඳවාගත් ඉපැයුම්	230
බැංකු ණය	120
වෙළඳ ලැබිය යුතු දෑ	80
ගෙවිය යුතු VAT	50
	930

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

2025 මැයි මාසය තුළ සිදුවූ ගනුදෙනු පහත පරිදි වේ.

(i) රු. මිලියන 94.4 ක භාණ්ඩ ණයට මිලදී ගැනීම (රු.මිලියන 14.4 ක VAT ඇතුලත්ය)

(ii) රු. මිලියන 141.6 ක භාණ්ඩ අත්පිට මුදලට විකිණීම (රු.මිලියන 21.6 ක VAT ඇතුලත්ය). මෙම විකුණූ භාණ්ඩ වල පිරිවැය මිලියන 75 කි.

(iii) රු. මිලියන 11.8 කට මිලට ගත් භාණ්ඩ ආපසු යවා ඇත. (රු.මිලියන 1.8 ක VAT ඇතුලත්ය)

(iv) රු. මිලියන 3 ක වට්ටමක් ලබාදීමෙන් පසු රු. මිලියන 37 ක් වෙළඳ ණයගැතියන්ගෙන් ලැබීම.

(v) රු. මිලියන 100 ක ණය හිමියන් රු. මිලියන 10 ක වට්ටමක් ලබාදීමෙන් පසුව පියවීම.

(vi) රු. මිලියන 1 ක භාණ්ඩ ගංවතුරෙන් විනාශයට පත්වූ පිරිසකට පරිත්‍යාග කිරීම.

(vii) 2025.04.01 දිනට තිබූ ගෙවිය යුතු VAT මිලියන 50 ගෙවා දැමීම.

(viii) රු. මිලියන 5 ක යන්ත්‍රයක් අත්පිට මුදලට ලබා ගැනීම.

(ix) රු. මිලියන 2 ක විදුලි බිල ගෙවා දැමීම.

(x) රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනීත කරමින් මිලියන 10 ක් සාමාන්‍ය කොටස් නිකුත් කිරීම.

(xi) දේපළ පිරියත උපකරණ මත ක්ෂය රු. මිලියන 8 කි.

(xii) රු. මිලියන 6 ක ආදායම් බදු ගෙවීම.

(xiii) රු. මිලියන 10 ක බැංකු ණය වාරිකයක් ගෙවූ අතර එහි ඇතුළත් පොලිය රු. මිලියන 2 කි.

අවශ්‍ය වන්නේ :

(1). 2025.05.01 දිනට ශේෂ සටහන් කර (i) සිට (xiii) දක්වා ගනුදෙනුවල බලපෑම ගිණුම්කරණ සමීකරණය භාවිතා කරමින් පෙන්නුම් කරන්න. එක් එක් අගයන් ඉදිරියෙන් (+) හෝ (-) යොදන්න. දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිතා කරන්න.

ගනුදෙනු අංකය	වත්කම් =				වගකීම් +			හිමිකම්	
	දේපළ පිරියත හා උපකරණ	තොග	වෙළෙඳ ලැබිය යුතු දෑ	මුදල්, මුදල් සමාන වෙනත් දෑ	බැංකු ණය	වෙළෙඳ ගෙවිය යුතු දෑ	VAT	සාමාන්‍ය කොටස්	රඳවා ගත් ඉපැයුම්

(2). 2025 මැයි මාසය සඳහා ලාභය (රඳවා ගත් ඉපයුම් තීරුව පදනම්ව) ගණනය කරන්න. (ලකුණු 25)

(ආ). ප්‍රදේශයේ තරුණ තරුණියන් රැකියා සඳහා පුහුණු කිරීමේ අරමුණෙන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන ලදී.

2025.03.31 න් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අදාල වේ.

(i) සාමාජික මුදල් හා ඇතුළත් වීමේ ගාස්තු
- සෑම සාමාජිකයකුම රු.1000 ක ඇතුළත් වීමේ ගාස්තුවක් ගෙවිය යුතුය.
- වයස අවුරුදු 15-25 අතර ඕනෑම කෙනෙකුට සාමාජික විය හැකි අතර මාසික සාමාජික මුදල රු.500 කි .
- දැනට සිටින සාමාජිකයන් සංඛ්‍යාව 50 කි.
- සාමාජිකයන් 40 දෙනෙකු වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා ඇත.
- ඉතිරි 10 දෙනා සාමාජික මුදල් ගෙවා ඇත්තේ මාස 6 කට පමණි.

(ii) පාඨමාලා ගාස්තු
- 2024 වසරේ පළමුවෙන්ම හඳුන්වා දුන් මාස 6 ක රූපලාවණ්‍ය පාඨමාලාව සඳහා සිසුන් 20 දෙනෙකු ලියාපදිංචි විය. පාඨමාලා ගාස්තුව මසකට රු.1000 කි. 15 දෙනකු මුළු පාඨමාලා ගාස්තුව ගෙවූ අතර ඉතිරි අය මාස 6 කට පමණක් පාඨමාලා ගාස්තු ගෙවන ලදී.
- පාඨමාලා උපදේශක සඳහා පාඨමාලා ගාස්තු ලෙස රු.18 000 ක මුදලක් ගෙවිය යුතුය. මෙය මුදලින් ගෙවා ඇත.

(iii) පාඨමාලා පවත්වාගෙන යන ස්ථානයෙ හි පහසුකම් භාවිතා කිරීම වෙනුවෙන්, මසකට රු.1500 ක මුදලක් එම ස්ථානයෙන් අය කරන අතර මුදලින් ගෙවා ඇත්තේ මාස 9 කට පමණි.

(iv) 2024.04.01 ඵලදායී ජීව කාලය වර්ෂ 5 ක් වන රු.500 000 ක් වටිනා ඉගෙනුම් උපකරණ තොගයක් පරිත්‍යාග ලෙස ලැබුණි. එය සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(v) ප්‍රවර්තන වර්ෂයේ සිට ආරම්භ වී වසර 5 ක කාලයක් තුළ මෙම පරිත්‍යාග සමානව ආදායම් තුළ හඳුනාගත යුතුය.
(vi) වර්ෂය තුළ මිලදීගත් රු.80 000 ක ලිපි ද්‍රව වලින් රු.50 000 ක් පමණක් භාවිතා කර ඇත.
(vii) ආයතනයේ මෙහෙයුම් වියදම් රු.25 000 ක් මුදලින් ගෙවා ඇත.
(viii) වෘත්තීය පුහුණුව ලබන සාමාජිකයන් සඳහා ගෙවන ලද ද්‍රව්‍ය වියදම රු.50 000 කි. ගමන් වියදම රු.20 000 කි.
(ix) 2024.04.01 දින වෘත්තීය පුහුණු ආයතනය සඳහා රජයෙන් ලද මුදල් පරිත්‍යාගය රු.30 000 කි.

අවශ්‍ය වන්නේ :
වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සඳහා,
(1) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ලැබීම් ගෙවීම් ගිණුම
(2) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශය පිළියෙල කරන්න. (ලකුණු 15)
(මුළු ලකුණු 40)

4. (අ). සීමිත ලංකා සමාගම VAT සඳහා ලියාපදිංචි සමාගමකි. VAT ප්‍රතිශතය 18% කි.
(i) 2026.04.01 දිනට ණයගැති ලෙජරයෙන් හා ණයහිමි ලෙජරයේ උපුටා ගත් තොරතුරු පහත දැක්වේ

ණය හිමියෝ	(රු.000)	ණයගැතියෝ	(රු.000)
අමිල	250	ලකිෂා	350
ගයාන්	150	මලීශා	400
සඳුප	225		

මෙම ශේෂයන්ගේ එකතුව 2026.04.01 දිනට පොදු ලෙජරයේ පාලන ගිණුම්වල ශේෂයන්ට සමාන විය.

(ii) 2026අප්‍රේල් මාසය තුළ, ණයහිමියන් සමග සිදුවූ ගනුදෙනු පහත දැක්වේ.
- 2026.04.01 අමිලගෙන් ගැනුම් රු.300 000 (VAT රහිත)
- 2026.04.03 ගයාන්ගේ ආරම්භක ශේෂය පියවීමට මුදල් ගෙවීම රු.130 000 කි
- 2026.04.12 සඳුපට ආපසු යැවුම් රු.11 800 කි. (VAT සහිත)
- 2026.04.15 සඳුපගෙන් ණයට ගැනුම් රු.295 000 කි. (VAT සහිත)
- 2026.04.20 අමිලගෙන් ණයට ගැනුම් රු.275 000 කි. (VAT රහිත)
- 2026.04.25 අමිල ගෙවූ මුදල රු.275 000 කි. මෙම මුදල ගෙවා ඇත්තේ 10% ක වට්ටමක් අඩුකල පසුවය
- 04.01 හා 04.20 දිනයන්හි සිදු කළ ගැනුම් මත VAT එකතු කළ යුතුය.

(iii) අප්‍රේල් මාසය තුළ ණයගැතියන් සමග සිදු කළ ගනුදෙනු
- 2026.04.03 ලකිෂාගෙන් මුදල් ලැබුනා රු.180 000 කි. මෙහිදී අඩු කර ඇති වට්ටම 10% කි.
- 2026.04.05 ලකිෂාට ණයට විකුණුම් රු.300 000 කි. (VAT රහිත)
- 2026.04.10 මලීෂාට ණයට විකුණුම් රු.472 000 කි. (VAT සහිත)
- 2026.04.13 මලීෂා ආපසු එවුම් රු.50 000 කි. (VAT රහිත)
- 2026.04.18 මලීෂාගෙන් මුදල් ලැබුණා රු.140 000 කි. දුන් වට්ටම රු.10 000 කි.
- 2026.04.20 සඳුනිට ණයට විකුණුම් රු.200 000 කි. (VAT රහිත)

(iv) අප්‍රේල් මාසයේ අනෙකුත් මුදල් ලැබීම් හා ගෙවීම්

	(රු.000)
<u>මුදල් ලැබීම්</u>	
බැංකු ණය	300 000
කුලි ආදායම්	120 000
විකුණුම් (VAT රහිත)	400 000
විකුණුම් (VAT සහිත)	236 000
<u>මුදල් ගෙවීම්</u>	
උපචිත විදුලි වියදම	12 000
ගැනුම් (VAT රහිත)	180 000
ණය වාරිකය (පොලිය රු.5 000 ක් ඇතුළත්ව)	25 000
ගැනුම් (VAT සහිත)	259 600
වැටුප් ගෙවීම්	45 000
VAT ගෙවීම	18 000
ලිබඩු මිලදී ගැනීම	120 000
විගණන ගාස්තු ගෙවීම	40 000

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

අවශ්‍ය වන්නේ :

(1) අප්‍රේල් මාසය සඳහා
   (i) මුදල් ලැබීම් ජ'නලය
   (ii) මුදල් ගෙවීම් ජ'නලය
   (iii) ගැණුම් ජ'නලය
   (iv) විකුණුම් ජ'නලය

(2) මුදල් ලැබීම් ජර්නලය සහ ගෙවීම් ජර්නලය ලෙජරයට පිටපත් කිරීමේ ජර්නල් සටහන්.

(3) ණයගැති ලෙජරය සහ ණයගැති ශේෂ ලැයිස්තුව.

(ලකුණු 25)

(ආ). සීමා සහිත සුමුදු සමාගම ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීමට සැලසුම් කරමින් සිටී. එය මිලදී ගැනීමට අදාළ මුදල් ප්‍රවාහ පහත දැක්වේ.

	(රු.000)
ගැනුම් මිල	1 500
ගෙන ඒමේ වියදම්	50
සවිකිරීමේ ගාස්තු	150

- යන්ත්‍රයේ අපේක්ෂිත සුන්බුන් අගය සහ ඵලදායී ජීව කාලය පිළිවෙලින් රු.200 000 ක් හා වසර 4 කි.
- ව්‍යාපෘතිය ආරම්භයේදී රු.300 000 ක කාරක ප්‍රාග්ධනයක් අවශ්‍ය වන අතර එය ව්‍යාපෘති අවසානයේදී නැවත ලබාගත හැක. ව්‍යාපාරය ආදායම් බදු 10% කි.
- යන්ත්‍රයෙන් අපේක්ෂිත ආදායම සහ වියදම පහත පරිදි වේ. (රු.000)

වසර	1	2	3	4
ආදායම	2 500	3 500	5 000	6 500
මෙහෙයුම් වියදම (ක්ෂය ඇතුළුව)	1 000	1 500	1 750	2 000

- ව්‍යාපෘතියේ 10% ක අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය මත වට්ටම් සාධක

වසර	1	2	3	4
වට්ටම් සාධකය	0.9	0.8	0.7	0.6

අවශ්‍ය වන්නේ :

(1) මූලික මුදල් ප්‍රවාහය ගණනය කිරීම
(2) වාර්ෂික මෙහෙයුම් මුදල් ප්‍රවාහය ගණනය කිරීම
(3) පර්යන්ත මුදල් ප්‍රවාහය ගණනය කිරීම
(4) ශුද්ධ වර්තමාන අගය ගණනය කිරීම
(5) මෙම යන්ත්‍රය මිලදී ගැනීම සුදුසුද යන්න නිර්දේශ හේතු සහිතව දක්වන්න. (ලකුණු 15)

(මුළු ලකුණු 40)

5. (අ). 2025.04.01 දින ආරම්භ කළ සදලි, අමායා සහ රුවින්දි පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ

- 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

	(රු.000)
විකුණුම්	3 900
විකුණුම් පිරිවැය	2 100
බෙදා හැරීමේ වියදම්	800
පරිපාලන වියදම්	140
වෙනත් වියදම්	636
මූල්‍ය වියදම්	20

- 2025.04.01 දින ව්‍යාපාරය ආරම්භ කිරීමේ දී සදලි,අමායා සහ රුවින්දි පිළිවෙලින් රු. මිලියන 5 ක්, රු.මිලියන 3 ක් සහ රු. මිලියන 2 ක් ප්‍රාග්ධනය යොදවා ඇති අතර ලාභ හෝ අලාභ ප්‍රාග්ධන අනුපාතයට බෙදා ගැනීමට එකඟ වී ඇත.
- වර්ෂය සඳහා ගිණුම් පිළියෙළ කිරීමේදී පහත දැක්වෙන වැරදි සහ මගහැරීම් සිදුවී ඇති බව අනාවරණය කරගෙන ඇත.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(i) ව්‍යාපාරයේ අලෙවිකලමනාකරු ලෙස තාවකාලිකව සේවය කරන අමායාට මාසිකව රු.30 000 ක් ගෙවිය යුතු අතර 2026 අවසන් කාර්තුවේ වේතනය තවම ගෙවා හෝ ගිණුම්ගත කර නැත.

(ii) 2026.03.01 දින සිදුවූ ගංවතුරෙන් රු.500 000 ක තොග හානි වූ අතර ඉන් 80% ක් වන්දි ගෙවීමට 2026.03.28 දින රක්ෂණ සමාගම එකඟ වී තිබුණි. තොග හානි වීම පිළිබඳ ගිණුම් ගත කර තිබූ අතර ලැබිය යුතු රක්ෂණ වන්දි පිළිබඳ ගිණුම් ගතකර නැත. ව්‍යාපාරය අවසන් තොගය භෞතිකව ආගනනය කර ගිණුම්ගත කර ඇත.

(iii) රුවින්දි සතු රු.3 000 000 ක් පිරිවැය වූ මෝටර් රථයක් 2025.10.01 දින ව්‍යාපාරට ලබා දුන් අතර එදිනම ව්‍යාපාරය විසින් රු.1 500 000 ක් ඇයට ගෙවන ලදී. ඉතිරිය ණයක් ලෙස සලකා වර්ෂ 3 ක් තුළ රුවින්දි ට ගෙවීමටත් එකඟ වී ඇත. ඒ පිළිබඳව කිසිවක් ගිණුම් ගත කර නැත.

(iv) සඳලි සහ අමායා විසින් සෑම මසකම රු.10 000 ක් හා රු.15 000ක් බැගින් භාණ්ඩ ගැනිලි සිදුකර ඇති අතර ඒ පිළිබඳ ගිණුම් ගත කර නැත.

(v) ඉහත බෙදා හැරීමේ වියදම් තුළ අලෙවි සේවකයන්ට ගෙවූ මූලික වැටුප රු.250 000 ක් දක්වා ඇත. එම වැටුප ගෙවීමේදී සේවක අර්ථසාධක අරමුදල සඳහා 10% ක් සහ සේවක ණය වාරිකය රු.20 000 ක් අඩු කර තිබුණි. ව්‍යාපාරය විසින් සේවක අර්ථසාධක අරමුදලට 15% ක් සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට 3% ක් දායක වේ. මූලික වැටුප ගෙවීම පමණක් ගිණුම් ගතකර ඇති අතර වෙනත් කිසිවක් ගිණුම් ගතකර නොතිබුණි.

(vi) 2026.03.31 දිනට ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය රු.1 440 000 ක් වූ අතර එය දිනට මුදල් ගිණුමේ ශේෂය සමඟ එකඟ නොවුණි. පසුව සිදුකළ ගිණුම් පරීක්ෂාවකදී පහත කරුණු අනාවරණය කරගන්නා ලදී.

- අත්පිට විකුණුම් සඳහා ලද රු.120 000 ක චෙක්පතක් අගරුවී ඇති අතර එම මුදල අය කර ගත නොහැකි ලෙස හඳුනාගන්නා ලදී.
- රුවින්දි චෙක්පතින් සිදුකළ ගැනිලි රු.150 000 ක් ව්‍යාපාරය ගිණුම් ගත කර නැත.
- සෘජු ප්‍රේෂණ ලෙස ලද තැන්පතු පොළිය රු.15 000 ක් ව්‍යාපාරය සටහන් කර නැත.
- ප්‍රචාරණ වියදම් වෙනුවෙන් නිකුත් කළ රු.180 000 ක චෙක්පතක් 2026.03.31 දින වන විටත් ගෙවීම් සිදුකර නැත.

(vii) 2026.03.31 දින සඳලි ව්‍යාපාරයෙන් ඉවත් වීමට තීරණය කරන ලදී. මෙදිනට කීර්ති නාමය රු.1 500 000 ක් ලෙස ආගණනය කළ අතර සඳලි ඉවත් වූ පසු අමායා සහ රුවින්දි 3:2 අනුපාතයට ලාභ බෙදා ගනිමින් ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ විය. එමෙන්ම එදිනට සඳලිට ගෙවිය යුතු වටිනාකම පියවීමට රු.1 000 000 ක් පිරිවැය වූ එදිනට සමුච්චිත ක්ෂය රු.200 000 ක් වූ යන්ත්‍රයක් එදිනට සාධාරණ අගය වන රු.850 000 පවරාදීමටත් ඉතිරි මුදල වර්ෂ දෙකක් තුළ ගෙවීමටත් එකඟ වී ඇත.

අවශ්‍ය වන්නේ :

(1) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සඳලි, අමායා සහ රුවින්දි හවුල් ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ සංශෝධනය කිරීම හා ලාභ හෝ අලාභ විසර්ජන ප්‍රකාශය පිළියෙළ කිරීම

(2) 2026.03.31 දිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් සහ ප්‍රාග්ධන ගිණුම් පිළියෙළ කිරීම.

(3) 2026.03.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර සංශෝධනයට පෙර මුදල් ශේෂය ගණනය කිරීම

(ලකුණු 30)

(ආ). සෙනුමිලි ව්‍යාපාරයේ 2026.03.31 දිනට පහත තොරතුරු සපයා ඇත

	(රු.000)
ජංගම වත්කම්	10 000
ජංගම නොවන වත්කම්	20 000
මුළු වත්කම් ප්‍රතිලාභ අනුපාතය	15%
ණයහිමි අනුපාතය	25%
ජංගම අනුපාතය	වාර 1

වර්ෂය තුළ රඳවාගත් ඉපයුම් ශේෂය රු.1 500 000 කින් පහළ ගොස් ඇති අතර වර්ෂය තුළ රු.1 200 000 ක සංචිත ප්‍රාග්ධනිත කර ඇත. සමාගම විසින් වර්ෂය තුල රු.800 000 ක ලාභාංශ බෙදා දී ඇති අතර රු.500 000 ක් පොදු සංචිතයට මාරු කර ඇත. වර්ෂයේ ආදායම් බදු වියදම රු.300 000 කි.

අවශ්‍ය වන්නේ :

(1) 2026.03.31 දිනට ජංගම වගකීම්

(2) 2026.03.31 දිනට මුළු හිමිකම්

(3) 2026.03.31 දිනට මුළු වත්කම්

(4) හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය

(5) පොලි ආවරණ අනුපාතය

(ලකුණු 10)

(මුළු ලකුණු 40)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

6. **(අ).** සමනළ පොදු සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ තොරතුරු පහත දැක්වේ.
මූල්‍ය තත්ත්ව ප්‍රකාශ සාරාංශය

	2026/03/31 දිනට (රු.'000)	2025/03/31 දිනට (රු.'000)
දේපළ පිරියත උපකරණ (ශුද්ධ)	4 500	3 800
තොගය	850	720
වෙළඳ ලැබිය යුතු දෑ	600	540
මුදල් හා මුදල් සමාන දෑ	350	180
මුළු වත්කම්	6 300	5 240
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	3 000	2 500
රඳවාගත් ඉපැයුම්	1 200	900
10% බැංකු ණය	800	1 000
වෙළඳ ගෙවිය යුතු දෑ	950	620
ගෙවිය යුතු බදු	250	180
ගෙවිය යුතු පොලිය	100	40
මුළු හිමිකම් හා වගකීම්	6 300	5 240

අතිරේක තොරතුරු :

(i) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පෙරළාභය රු.650 000 කි.

(ii) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ රු.300 000 ක් පිරිවැය හා රු.200 000 ක් සමුච්චිත ක්ෂය වූ උපකරණයක් රු.120 000 කට විකුණා ඇත.

(iii) වර්ෂය තුළ දේපල පිරියත උපකරණ අයිතමයක් මිලට ගෙන ඇති අතර ඒ සඳහා රු.1 000 000 ක් මුදලින් ගෙවා ඉතිරි මුදල පියවීම සඳහා සාමාන්‍ය කොටස් අදාළ ආයතනය වෙත නිකුත් කර ඇත.

(iv) වර්ෂයට අදාල දේපල පිරියත උපකරණ ක්ෂය රු.450,000 කි.

(v) වර්ෂයට අදාල පොලී වියදම රු.150 000 ක් වූ අතර ගෙවූ ලාභාංශ රු.100 000 කි.

(vi) වර්ෂය තුළදී රඳවාගත් ඉපයීම් භාවිතා කරමින් රු.100 000 ක සංචිත ප්‍රාග්ධනිත කිරීමක් සිදුකර ඇති අතර වර්ෂය තුළ හිමිකම් නිකුතුවක් ද සිදුකර ඇත.

අවශ්‍ය වන්නේ :

LKAS 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශන ප්‍රමිතියට අනුව 2026/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සමනල පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරන්න.
(මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ඇති වූ මුදල් ප්‍රවාහ පෙන්නුම් කිරීමේදී වක්‍ර ක්‍රමය භාවිතා කරන්න)

(ලකුණු 20)

(ආ). විදුසර සිසු සමිතිය මගින් සංවිධානය කරනු ලබන වාර්ෂික සුහද හමුව සඳහා ඇස්තමේන්තු ගත තොරතුරු පහත දැක්වේ. මෙම උත්සවය සඳහා ආරාධිත අමුත්තන් 5 දෙනෙකු සහභාගි කර ගැනීමට සැලසුම් කර ඇති අතර සාමාජිකයන් 100 දෙනෙකු සහභාගී කර ගැනීමට අපේක්ෂා කරයි. උත්සවය සඳහා අපේක්ෂිත පිරිවැය පහත දැක්වේ.

	(රු.000)
උත්සව ශාලා කුලිය	25 000
සංගීත කණ්ඩායමේ පිරිවැය	15 000
ප්‍රචාරණ කටයුතු සඳහා	5 000
ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා	4 500
සැරසිලි සඳහා	10 000
එක් පුද්ගලයකු සඳහා දිවා ආහාර පාන පිරිවැය	1 500
සාමාජිකයකු සඳහා ටී ෂර්ට් එකක පිරිවැය	1 000
ආරාධිත අමුත්තන් සඳහා සමරු තිළිණ පිරිවැය	8 000

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

අතිරේක තොරතුරු,

සමිතිය විසින් මෙම සුහද හමුව සඳහා එක් සාමාජිකයකුගෙන් රු.3500 ක සහභාගිත්ව ගාස්තුවක් අය කිරීමට තීරණය කර ඇත. ආරාධිත අමුත්තන් සඳහාද දිවා ආහාරය ලබාදීමට තීරණය කර ඇත. සහභාගී වන සාමාජිකයන් සඳහා දිවා ආහාරය හා ටී ෂර්ට් එකක් ලබාදීමට අපේක්ෂිතය.

අවශ්‍ය වන්නේ :

(1) උත්සවයේ මුළු ස්ථාවර පිරිවැය
(2) සාමාජිකයකු සඳහා විචල්‍ය පිරිවැය
(3) සාමාජිකයකුගේ දායකය
(4) උත්සවයේ මුළු පිරිවැය ආවරණය කර ගැනීමට සහභාගි විය යුතු අවම සාමාජික සංඛ්‍යාව
(5) රු.20 000 ක ලාභයක් අපේක්ෂා කරන්නේ නම් සහභාගි විය යුතු සාමාජික සංඛ්‍යාව
(6) උත්සවය සඳහා සාමාජිකයන් 50 දෙනෙකු සහභාගි වන්නේ නම් මුළු පිරිවැය ආවරණය කර ගැනීමට එක් සාමාජිකයකුගෙන් අය කළ යුතු සාමාජික ගාස්තුව

(ලකුණු 20)

(මුළු ලකුණු 40)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2026 -අවසාන වාර පරීක්ෂණය

13 ශ්‍රේණිය- ගිණුම්කරණය

සංශෝධන

1 පත්‍රය

- ප්‍රශ්න අංක 23 හා 24 ට අදාල සිද්ධියෙහි, වර්ෂය තුළ මුළු වියදම් වල එකතුව රු. 700 000 ලෙසට සංශෝධනය විය යුතුය.(රු.600000 වෙනුවට)
- ප්‍රශ්න අංක 28 හා 29 ට අදාල සිද්ධියෙ හි දායක විකුණුම් අනුපාතය 50% ලෙසට සංශෝධනය විය යුතුය.
- ප්‍රශ්න අංක 29 - ඒකක 9000 ක් ලෙසට සංශෝධනය කළ යුතුය.

11 පත්‍රය

ප්‍රශ්න අංක 03

(ආ) (ii)

පාඨමාලා ගාස්තු යටතේ,15 දෙනෙකු මුළු පාඨමාලා ගාස්තු ගෙවූ අතර ඉතිරි අය මාස 03 ට පමණක් ලෙස සංශෝධනය විය යුතුයි(මාස 06 වෙනුවට)

ප්‍රශ්න අංක 5

(ආ) ණය හිමි අනුපාතය යන්න, ණය හිමිකම් අනුපාතය ලෙස සංශෝධනය විය යුතුය.සංචිත ප්‍රාග්ධනිත කර ඇත යන්න රදවාගත් ඉපයුම් ප්‍රාග්ධනිත කර ඇත ලෙස සංශෝධනය විය යුතුය.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

12ශ්‍රේණිය ගිණුම්කරණය

සංශෝධන

ප්‍රශ්න අංක 08

පිළිතුර අංක 3 වරණය

වත්කම්	= වගකීම්	+ හිමිකම්
(3) 60000 =	=.------	+ 60000

ප්‍රශ්න අංක 16

පිළිතුරු වරණ

අංක 05 රු.5000

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අ.පො.ස.(සා.පෙළ) - 13 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය - 2026

1 පත්‍රය - පිළිතුරු

1	03	11	02	21	04
2	01	12	05	22	04
3	01/05	13	04	23	03
4	05	14	04/05	24	04
5	01	15	03	25	04
6	01	16	05	26	05
7	03	17	04	27	05
8	05	18	04	28	03
9	05	19	03	29	03
10	02	20	03	30	03

31.

	මූල්‍ය ගිණුම්කරණය	කළමනාකරණ ගිණුම්කරණය
A	මූල්‍ය	මූල්‍ය/මූල්‍ය නොවන
B	ඇත	නැත

32. 1.වැඩි වේ.

2.අඩු වේ.

33. A. පොදු ජ ර්නලය

B. පොදු ජර්නලය

C. ඉන්වොයිසිය/ලදු පත

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

D. ඉන්වොයිසිය

34. (අ) ගැනුම් ගිණුම හර 295000

ණය හිමි පාලන 295000

(ආ) ගැනුම් ගිණුම හර 250000

Vat පාලන හර 45000

ණය හිමි පාලන 295000

35. වියදම්

වියදම්

වගකීම්

ආදායම්

36. (අ) 4500/5000

විෂයානුගත භාවය/ගැලපුම්

(ආ) 8600 උපලබ්ධි

37. රු.350400

38. රු.4 000 000

39. රු.6,500,000

40. 1.ඓතිහාසික පිරිවැය/

2.ප්‍රවර්තන /වර්තමාන වටිනාකම

41. 1. ×

2. ✓

3. ✓

4. ×

42. C පමණි

43. (අ) රු.2100 000

(ආ) රු.1800000

44. (අ) රු.487500

(ආ) රු. 162500

45. D සහ E පමණි

46. 1.✓

2.×

3.✓

4.✓

47. (අ) ඒකක 1200

(ආ) වාර 60

48. (අ) 38200

(ආ) 21000

49. (අ) රු.1000

(ආ) රු.2800 000

50. (අ) වර්ෂ 4

(ආ) 21.8% හෝ 16% (50 x 4) ලකුණු 200

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources